**ශීර්ෂය 140 - පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

---

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

**1 කොටස** - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව.

**2 කොටස** - එක් එක් ශීර්ෂයට අදාළ විස්තරාත්මක වාර්තාව.

## 1 කොටස

**පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව.**

---

**1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුව**

| ශීර්ෂය | දෙපාර්තමේන්තුව |
|---|---|
| 292 | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව |

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.3,008,567,679 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.2,427,801,036 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් පිළිවෙලින් රු.367,583,402 ක් හා රු.213,183,241 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 17 ක් හා සියයට 25 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| 140 | 2,155,811,679 | 1,788,228,277 | 367,583,402 | 17 |
| 292 | 852,756,000 | 639,572,759 | 213,183,241 | 25 |
| **එකතුව** | **3,008,567,679** | **2,427,801,036** | **580,766,643** | **19** |

## 2.2 අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂයය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 14001 | 6,000,000 | 3,398,348 | 3,700,000 | 4,415,583 | 30,000,000 | 13,803,799 |
| 29201 | 28,000,000 | 25,803,127 | 15,000,000 | 23,344,769 | 110,000,000 | 74,578,441 |

**2.2.2 පොදු තැන්පත් ගිණුම්**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.19,618,808 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය | 6000/0000/00/0015/0052/000 | 2,418,438 |
| සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0147/000 | 17,200,370 |
| **එකතුව** | | **19,618,808** |

**2 කොටස**

**එක් එක් ශීර්ෂයට අදාළ විස්තරාත්මක වාර්තාව**

**1. ශීර්ෂය 140 - පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය**

**1.1 විගණන විෂය පථය**

පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 නොවැම්බර් 02 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.11 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

### (ආ) විගණන සාක්ෂි නොවීම

“ ස්වයං රැකියා වක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය ” සඳහා රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යන ඉතිරි කිරිමේ ගිණුමට අදාල පාස්පොත විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. 2013 සැප්තැම්බර් 12 දින වන විට මෙම ගිණුමේ ශේෂය රු.8,252,704 ක් වූ අතර, ප්‍රතිලාභීන් සඳහා රු.3,845,061 ක ණය ලබා දී තිබුණි. මෙම ණය ගෙවීම්වලට අදාල විස්තර කිසිවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### (ඇ) විගණන විමසුම් වලට පිළිතුරු දීම

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද විගණන විමසුමකට 2014 නොවැම්බර් 15 දිනටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුමට අදාල ගණනය කළ හැකි වටිනාකම රු. 18,370,797 ක් විය.

**(ඇ) අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 2 ක් සඳහා සළසා තිබුණු රු.16,020,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයයන් 18 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 ත් සියයට 94 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(iii) වැය විෂයයන් 10 කට අදාළව රු.130,158,523 ක ඌණ ප්‍රතිපාදන සළසා තිබුණු අතර එම වැය විෂයයන් සඳහා මුදල් රෙගුලාසි 66 මාරුකිරීම මඟින් රු.3,229,000 ක හා පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මඟින් රු.130,675,679 ක ප්‍රතිපාදන ලබාගෙන තිබුණි.

**(ඉ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 14001 දරන අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.649,918 ක් වූ අතර, වසර 17 ට වඩා පැරණි, සේවය අතහැරගිය හා ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.950,491 ක් ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

## 1.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 1.4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ 1.4.1 ඡේදය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද, ලිංග නිර්ණ කරන ලද ශුක්‍ර වඩි 30,000 ක් ආනයනය කිරීමේ කාර්යය එම සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

### 1.4.2 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අභ්‍යන්තර විගණන සැලැස්මේ ඇතුළත් කිරි නිෂ්පාදනය සඳහා වූ තෘණ වගා ව්‍යාපෘතිය පිළිබඳව විගණනයක් සිදුකර නොතිබුණි.

**1.5 වත්කම් කළමනාකරණය**

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය වත්කම්**

අමාත්‍යාංශය සතු වාහන 06 ක් මාස 11 සිට මාස 32 ක් දක්වා වූ පරාසයක කාලයක සිට නිෂ්ක්‍රීයව පැවැතුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

සියළුම අංශයන් නියෝජනය වන පරිදි අමාත්‍යාංශයේ භාණ්ඩ සමීක්ෂණය කළයුතු වුවද, 2013 වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය සතු වාහන 63 ක් සම්බන්ධයෙන් සමීක්ෂණය සිදුකර නොතිබුණි.

**(ඇ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

හිටපු අමාත්‍යවරයා වෙත ලබා දී තිබුණු වාහන 05 ක් නැවත අමාත්‍යාංශය වෙත භාර දී නොතිබුණි.

**(ඈ) බේරුම් නොකළ බැරකම්**

අමාත්‍යාංශය විසින් 2013 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂයට අඩු කාලයක සිට පැවැත එන එකතුව රු.3,006,245,368 ක බැරකම් විය.

ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 140–2–4–2502(2) දරන වැය විෂය යටතේ නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට බැරකම් ලෙස රු.15,101,329 ක් දැක්විය යුතු වුවද , රු.66,580,250 ක් දක්වා තිබීම හේතුවෙන් රු.51,478,921 ක් වැඩියෙන් ගිණුමේ දක්වා තිබුණි.

(ii) මුදල් රෙගුලාසි 94(1) අනුව වෙනත් ආකාරයකට විධි විධාන සලසා ඇති අවස්ථාවලදී හැර වාර්ෂික ඇස්තමේන්තුවල ඒ සඳහා මුදල් ප්‍රතිපාදන සලසා ඇත්නම් විනා දෙපාර්තමේන්තුවක් විසින් කිසිදු වියදමකට හෝ බැඳීමකට හෝ නොබැඳිය යුතු බව සඳහන් කර තිබුණද , ඇස්තමේන්තුවෙහි ප්‍රතිපාදන මුදල ඉක්මවා රු.3,006,245,368 ක බැරකම් වටිනාකමක් භාණ්ඩාගාර උපදෙස් මත මිල්කෝ ආයතනයේ සැකසුම් කර්මාන්තශාලා නවීකරණය යටතේ දක්වා තිබුණි.

**1.6** **අනුකූල නොවීම්**

**-----------------**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

-------------------------------------------------------

2010 වර්ෂයේදී අමාත්‍යාංශය වෙත පැවරුණු රැකියා ව්‍යාපෘති සඳහා වතුකරයේ තරුණ තරුණියන්ට ණයදීම පිණිස පිහිටුවා තිබුණු රු.10,300,000 ක් වූ චක්‍රීය අරමුදල මෙහෙයවීම සම්බන්ධයෙන් 2006 දෙසැම්බර් 22 දිනැති අංක 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ සඳහන් කර තිබුණු විධිවිධාන කිසිවක් අනුගමනය කර නොතිබුණි.

**1.7** **ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා**

**--------------------------------------**

ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් හා මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොමැති ව්‍යාපෘති පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ)** **ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

---------------------------------

අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කර තිබුණු ඇස්තමේන්තු වටිනාකම රු.42,465,652 ක් වූ ව්‍යාපෘති 34 ක් සඳහා ගෙවිය යුතු මුදල රු. 18,125,901 ක් වූ අතර, නිසි ඇගයීමකින් හා පසු විපරමකින් පසු එම මුදල් ගෙවීමට ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණු බැවින් ව්‍යාපෘති වල මූල්‍ය ප්‍රගතිය සියයට 10 ක පමණ අවම මට්ටමක පැවතුණි.

**(ආ)** **මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

---------------------------------------------------------------------

(i) වැසිකිලි ඉදිකිරීම් හා ජල සැපයීම් ව්‍යාපෘති සඳහා රුපියල් 41,349,612 ක් වැයකර උප ව්‍යාපෘති 103 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර පසුව 2013 දෙසැම්බර් 31 දින වන විට ඒ සඳහා රු.7,450,498 ක් අදාල නියෝජිත ආයතන වෙත ගෙවා තිබුණද, 2013 දෙසැම්බර් 31 දින වන විටද එම ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණු බව විගණනයට ඉදිරිපත් කල වාර්ෂික ප්‍රගති වාර්තා අනුව නිරීක්ෂණය විය.

(ii) ග්‍රාමීය ප්‍රජා අංශයේ කාර්ය සාධන වාර්තාවට අනුව ග්‍රාමීය ප්‍රජා සංවර්ධනය යටතේ විවිධ උප ව්‍යාපෘති 24 ක් පළාත් පාලන ආයතන හා වැවිලි නිවාස සංවර්ධන භාරය හරහා ක්‍රියාත්මක කිරීම සඳහා රු.54,730,077 ක මුදලක් වෙන්කරගෙන තිබුණද , මෙම ව්‍යාපෘති සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි.

(iii) අමාත්‍යාංශ වැය ශිර්ෂයෙන් බාහිර පුද්ගලයෙක් වෙත විදුලිය සැපයීම සඳහා රු.39,775 ක් ගෙවා තිබුණි.

**1.8 කාර්යසාධනය**

------------------

2013 ක්‍රියාකාරී සැලැස්මට අනුව, ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(01) **පශු සම්පත් අංශය**

-------------------

(i) දියර කිරි පරිභෝජනය (වැය විෂයය අංක 140 – 2 – 3 2502 (3)) යටතේ කිරි විකුණුම් මධ්‍යස්ථාන ආරම්භ කිරීම, කිරි එකතු කිරිම වැඩිදියුණු කිරීම, ප්‍රවර්ධන වැඩ සටහන, කිරි ශීත කිරීම් ටැංකි ප්‍රසම්පාදනය හා ව්‍යාපෘති මෙහෙයුම් කටයුතු සඳහා ප්‍රතිපාදනය කර තිබු මුදල රු. මිලියන 40 කි. මෙයින් සමාලෝචිත වර්ෂය අවසානයට වැයකර තිබු මුදල රු.9,639,089 කි. කිරි විකුණුම් මධ්‍යස්ථාන 18 ක් ආරම්භ කිරිම ඉලක්ක කර තිබු අතර ආරම්භ කර තිබුණේ 12 ක් පමණි. ව්‍යාපෘතියේ ඉතිරි එක් එක් කාර්යය සඳහා වු ඉලක්ක හා ප්‍රගතිය පිළිබඳ තොරතුරු ඉදිරිපත් නොකිරිම නිසා කාර්ය සාධනය පිළිබඳ පරීක්ෂා කල නොහැකි විය.

(ii) කුඩා හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපල ක්‍රමය සංවර්ධනය කිරිමේ ව්‍යාපෘතිය (අංක 140-2-3-2502(19)) යටතේ පහත දැක්වෙන ව්‍යාපෘති කාර්යයන් 07 සඳහා සමාලෝචිත වර්ෂයේදී වෙන්කල ප්‍රතිපාදනය රු.මිලියන 20 ක් වු අතර සමාලෝචිත වර්ෂය අවසානයට වියදම රු.මිලියන 9,137,495 ක් විය. මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය පහත පරිදි වේ.

| **ව්‍යාපෘතිය** | **2013 ක්‍රියාකාරී සැලැස්ම අනුව අපේක්ෂිත ඉලක්ක** | **ප්‍රගති සමාලෝචන වාර්තාව අනුව ප්‍රගතිය (2013 දෙසැම්බර් 31 දිනට)** |
|---|---|---|
| කුඩා පරිමාණ ගොවිපල ආරම්භ කිරිම | 2000 | 1500 |
| කුඩා HETCHERIES ආරම්භ කිරීම | 5 | 2 |
| ශීත ගබඩා පහසුකම් | 2 | - |
| කුඩා නිෂ්පාදන ඒකක ආරම්භ කිරිම | 25 | 7 |
| කුඩා ආහාර නිෂ්පාදන ඒකක ආරම්භ කිරිම | 15 | 5 |
| ජංගම විකුණුම් ඒකකය | 20 | 3 |
| ප්‍රවර්ධන වැඩසටහන | - | - |

(iii) 2013 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් නොවූ කාර්යයක් වූ ලිංග නිර්ණය කරන ලද ගව ශුක්‍රාණු වඩි 30,000 ක් රු.2,200 බැගින් ආනයනය කිරීම සඳහා අංක 70 හා 2013 මාර්තු 18 දිනැති පරිපූරක ඇස්තමේන්තුව මඟින් රු.65,978,637 ක් ලබා දී තිබුණි. එහෙත් ආනයනය කර තිබුණේ වඩි 14,500 ක් පමණි. එම වඩි 14,500 සඳහා රු.62,386,985 වැය කර තිබූ අතර එක් වඩියක මිල රු.2,200 සිට රු.4,302 ක් දක්වා වැඩි වී තිබුණි.

(02) **ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අංශය**

-------------------------------

**(අ)** ප්‍රජා මූලික සංවිධානයන් ශක්තිමත් කිරීම තුලින් ග්‍රාමීය ජ්‍රජාව බල ගැන්වීම සඳහා රු.මිලියන 360 ක් ඇස්තමේන්තු කර, විවිධ අංශයන් යටතේ වැඩසටහන් 9 ක් හා එම ව්‍යාපෘතීන් අධීක්ෂණය කිරීම් හා ඇගයීම් සඳහා එක් ව්‍යාපෘතියක් වශයෙන් ව්‍යාපෘති 10 ක් ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබුණි.

මේ පිළිබඳව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ක්‍රියාකාරී සැලැස්මේ කාලරාමුව අනුව එක් එක් කාර්යන්හි භෞතික හා මූල්‍ය කාර්ය සාධන ඉටු කිරීම අධීක්ෂණය හා ඇගයීම් සඳහා වෙන් කර තිබූ රු.මිලියන 3.5 ඉක්මවා රු.2,024,211 ක්ද වැයකර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය සඳහා අනුමත කරතිබූ ව්‍යාපෘති 268 කින් නිමකර තිබුණේ ව්‍යාපෘති 26 ක් පමණි.

(ii) වැවිලි නිවාස සංවර්ධන භාරය වෙත පිරිනමා තිබූ කොරන්ගුමලේ මාර්ගයේ කොටසක් තාර දැමීම සඳහා වූ කොන්ත්‍රාත්තුවේ අවසාන ගෙවීම වශයෙන් රු.1,113,733 ක් 2014 ජනවාරි 29 දින කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණද දින 184 කට අදාළ රු.92,000 ක්වූ ප්‍රමාද ගාස්තුව අයකරගෙන නොතිබුණි.

(iii) විශේෂ ව්‍යාපෘති යටතේ වන, ජලනල දීර්ඝ කිරීමේ ව්‍යාපෘතියක් සඳහා කෑගල්ල වැවිලි නිවාස සංවර්ධන භාරය වෙත රු.1,278,404 ක් ගිවිසුමකින් තොරව ගෙවා තිබුණි. 2014 ජනවාරි 17 දින වන විටද ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිමකර නොතිබූ අතර ගිවිසුමක් නොතිබීම හේතුවෙන් ව්‍යාපෘතිය නිමකළ යුතු දිනය, අදාල කොන්දේසි හා ප්‍රමාද ගාස්තු අයකර ගැනීම් පිළිබඳ විස්තර කිසිවක් පරීක්ෂා කිරීමට ද නොහැකි විය.

(iv) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද අවිච්ඡේදව පැවති ග්‍රාමීය ප්‍රජා අංශයේ ක්‍රියාත්මක කරන ලද බොහෝ ව්‍යාපෘතිවල මාස 03 ක්වූ ගිවිසුම් කාලය අවසන් වී තිබුණද, නියෝජිත ආයතන වල ඉල්ලීම් අනුව අමාත්‍යාංශය විසින් ගිවිසුම් කාලය දීර්ඝ කර තිබුණි. කාලය දීර්ඝ කිරීමට නියෝජිත ආයතන දක්වා තිබු හේතු සාධාරණ බවට තහවුරු කළ හැකි සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි.

**(ආ) සැලැසුම් කිරීම**

**-----------------**

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකිරීම**

-----------------------------------------------------------

එක් එක් ව්‍යාපෘති බාණ්ඩ යටතේ සිදු කිරීමට අපේක්ෂිත උප ව්‍යාපෘති සංඛ්‍යාව හා ඒ සඳහා වෙන්කරන ලද මුදල හා අනෙකුත් විස්තර 2013 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි දක්වා නොතිබීම හේතුවෙන් සැලැස්මේ ඇතුළත් ව්‍යාපෘති වලට අදාල ප්‍රගති වාර්තා සමඟ සැසඳීමක් කළ නොහැකි විය.

**1.9 පාඩු හා හානි**

**---------------**

වසර 15 කට පෙර වාහන 5 කට සිදු වී තිබු රු.245,229 ක් වු හදිසි අනතුරු අලාභ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**1.10 කළමනාකරණ දූර්වලතා**

**-------------------------**

2000 අගෝස්තු 24 දින පැවැති අමාත්‍ය මණ්ඩලය තීරණය ප්‍රකාර යෞවනයින් රැකියා වලට පුහුණු කිරීමේ වැඩසටහන යටතේ ස්වයංරැකියා සැපයීමේ අරමුණෙන් වතුකරයේ තරුණ තරුණයින්ට ණය ලබාදීම පිණිස භ්‍රමණ අරමුදලක් ඇති කිරීම සඳහා රාජ්‍ය බැංකුවක රුපියල් දශලක්ෂයක් තැන්පත් කිරීම පිළිබඳව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අනුමත මුදල ඉක්මවා රු.300,000 ක් 2004 වර්ෂයේදී බැංකුවේ තැන්පත් කර තිබුණි.

(ආ) 2013 සැප්තැම්බර් 12 දිනැති බැංකු ප්‍රකාශය අනුව 2000 වර්ෂයේ සිට බැංකුවේ තැන්පත් කර තිබුණු මුදලින් රු.3,845,061 ක් (අරමුදලින් සියයට 37 ක්) ප්‍රතිලාභීන් සඳහා ණය වශයෙන් ලබා දී තිබුණි. ඉතිරිය වු රු.8,252,704 බැංකුවේ නිෂ්කාර්යව පැවතුණි. අමාත්‍යාංශය විසින් අරමුදල තුලින් අපේක්ෂා කළ අරමුණු ළඟාකර ගැනීමට අපොහොසත්ව තිබුණි.

(ඇ) 2011 වර්ෂයේ සිට චක්‍රීය අරමුදල සම්බන්ධයෙන් බැංකුව සමඟ ඇතිකරගත් ගිවිසුම අවලංගු වී තිබුණද, එම අරමුදල නිසි ක්‍රියාකාරකමකට යොදවා නොගත් කාලය සඳහා සාමාන්‍ය ඉතිරි කිරීම් වලට ගෙවනු ලබන පොළී මුදල ගිණුමට බැර කරන ලෙසට බැංකුවට දන්වා නොතිබුණි. 2011 වර්ෂයේදී අවලංගු වූ ගිවිසුම බලාත්මක කර මෙම අරමුදලේ අරමුණ ඉටුකර ගැනීමට බැංකුව සමඟ එකඟතා ගිවිසුමක් ඇති කර ගැනීමට 2014 සැප්තැම්බර් 20 දින වන විටද අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(ඇ) බැංකුවෙන් ලැබෙන සියයට 02 ක පොළිය ලබාගැනීම හැර 2011 වර්ෂයේ සිට මෙම අරමුදලින් කිසිදු ප්‍රතිලාභයක් ලබාගෙන නොතිබු අතර, අරමුදල ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය කිසිදු ඉදිරි වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වී නොතිබුණි. 2010 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා මෙම අරමුදල මගින් ණයදීම පිළිබඳ වතුකරයේ තරුණ තරුණියන් දැනුවත් කර තිබේද යන්න පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 1.11 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 27 | 21 | 06 |
| (ii) | තෘතියික මට්ටම | 05 | 04 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 88 | 66 | 22 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 70 | 55 | 15 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 06 | 04 | 02 |
| | **එකතුව** | **196** | **150** | **46** |

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 46 ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

**(ආ) වෙනත් පාර්ශවයන්ට නිදහස් කල මානව සම්පත්**

**--------------------------------------------------**

අමාත්‍යාංශය විසින් 2010 – 2013 කාලපරිච්ඡේදය තුලදී වෙනත් පාර්ශවයන්ට අවිධිමත් ලෙස මුදාහැර තිබුණු මානව සම්පත් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| සේවක වර්ගය | සේවක සංඛ්‍යාව | වෙනත් පාර්ශවය | මුදාහැර ඇති කාලය | අමාත්‍යාංශය ගෙවන වැටුප |
|---|---|---|---|---|
| ද්විතීය මට්ටම | 01 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ගැමිදිරිය පදනම | 2013 දෙසැම්බර් 31 දක්වා | අමාත්‍යාංශය ගෙවීම් නොකරයි. |
| ද්විතීය මට්ටම | 02 | පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා | 2011 සැප්තැම්බර් 19 සිට මන්ත්‍රීවරයා කැමති කාලයකට | රු.25,116/- (ප්‍රතිපූර්ණය කිරීම) |
| | | | 2010 දෙසැම්බර් 01 සිට මන්ත්‍රීවරයා කැමති කාලයකට | රු.26,664/- (ප්‍රතිපූර්ණය කිරීම) |
| ප්‍රාථමික මට්ටම | 01 | නැවත පදිංචි කිරීම, සංවර්ධනය හා ආරක්ෂාව පිළිබඳ ජනාධිපති කාර්ය බලකාය | 2013 ජනවාරි 01 දින සිට | රු.26,082/- (ප්‍රතිපූර්ණය කිරීම) |

## 2. ශීර්ෂය 292 - සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### 2.1 විගණන විෂය පථය

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ජූලි 28 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන් , වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ සහ ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 2.3 විගණන නිරීක්ෂණ

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.9 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) අයවැය විචලනය

අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් වැය විෂයයන් 07ක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 12 සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ආ) අග්‍රිම ගිණුම්

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්ය නිම කළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කිරීමට කටයුතු නොකර කාර්ය නිමවී මාස 1 ½ ක ප්‍රමාදයකින් පසුව අතුරු අග්‍රිම නිරවුල් කර තිබුණි.

(ii) මුදල් රෙගුලාසි 371 ට පටහැනිව අවස්ථා 12 කදී නිලධාරීන් 04 දෙනෙකු වෙත රු.20,000 ඉක්ම වූ එකතුව රු.150,200 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

(ඇ) පොදු තැන්පත් ගිණුම

-------------------------

වර්ෂ 02 ක් ඉක්ම වූ රු.3,534,952 ක් වූ තැන්පතු 58 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඈ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

-----------------------------------------------------------------

විෂය අංක 29201 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.642,572 ක් වූ අතර, එම ශේෂයන්ගෙන් වර්ෂ 02 කට වඩා හිඟහිටි ශේෂවල එකතුව රු.283,935ක්ව පැවතුණි. එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

## 2.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

------------------------------------------

**අභ්‍යන්තර විගණනය**

--------------------------

දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර ක්‍රියාත්මක කර තිබුණු අතර 2013 වර්ෂයේදී විගණන විමසුම් 30 ක් නිකුත් කර තිබුණි. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන සංවර්ධන වැඩසටහන් 02 කට අදාලව 2013 වර්ෂයේ රු.මිලියන 472.5 ක මූලධන ප්‍රතිපාදනයන් සළසා තිබුණත් අභ්‍යන්තර විගණන අංශය විසින් එම සංවර්ධන ව්‍යාපෘතිවලට අදාලව විගණන වැඩසටහන් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි. පැමිණීම, පිටවීම, නිවාඩු, තොග පොත්, බඩු වට්ටෝරු ලේඛන ආදී ලේඛනවලට පමණක් අභ්‍යන්තර විගණනය සීමා කර තිබුණි.

## 2.5 වත්කම් කළමනාකරණය

------------------------------

වත්කම් කළමනාකරණය සම්බන්ධයෙන් කළ නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිෂ්ක්‍රිය හා ඌණ උපයෝජිත වත්කම්

---

පශු පර්යේෂණ අංශයේ ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ හා පැරණි කල් ඉකුත් වූ රසායනික ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් ඒ ඒ අංශවල හා ප්‍රධාන ගබඩාවේ අසුරා තිබුණි. මේවා අතුරින් 1986 සිට 2008 වර්ෂය දක්වා කාල පරාසයකට අයත් කාර්යාල උපකරණ හා රසායනාගාර උපකරණ විෂයයන් 623 කට අදාලව ඒකක 2917 ක්ද, 2005 වර්ෂයට පෙර ගබඩාවට ලැබී තිබුණු විෂයයන් 40 කට අදාල ඒකක 135 ක් ද විගණන දිනය වූ 2014 ජූනි 30 දින වන විටත් ගබඩාවේ නිෂ්ක්‍රියව පැවතුණි.

(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

---

වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු අනාවරණය විය.

(i) 2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මඟින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2014 මාර්තු 31 දිනට ප්‍රථම සිදුකර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් දෙපාර්තමේන්තුවට අයත් ඒකක 58 කින් ඒකක 26 කට අදාල වාර්තා පමණක් 2014 මැයි 31 දින වන විට විගණනයට ඉදිරිපත් කර තිබුණි.

(ii) භාණ්ඩ සමීක්ෂණය කර ඉදිරිපත් කළ වාර්තාවලින් පෙන්වා දී තිබුණු නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

(ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම

---

පළාත් සභාව හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත්ව තිබූ ඉඩම් ඒකක 19 ක් විධිමත් අනුමැතියක් නොමැතිව දෙපාර්තමේන්තුව විසින් භාවිතයට ගෙන තිබුණි.

(ඇ) බේරුම් නොකළ බැරකම්

---

දෙපාර්තමේන්තුව විසින් 2013 දෙසැම්බර් 31 දිනට රු.28,395,752 ක බැරකම් විසර්ජන ගිණුමෙහි අනාවරණය කර නොතිබුණි.

**2.6 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | මුදල් රෙගුලාසි 115(4) | පූර්ව මුදල් වර්ෂයට කලින් වූ මුදල් වර්ෂයට අදාල ගෙවීම් සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ආ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | |
| | 1998 දෙසැම්බර් 30 දිනැති අංක 29/98 දරන චක්‍රලේඛය | චක්‍රලේඛයේ 4.8 ඡේදයේ විධිවිධානවලට අනුකූල නොවන ලෙස භාෂා පරිවර්තක නිලධාරින් සිටියදී භාෂා දීමනා ලබාගන්නා නිලධාරියෙකුට භාෂා පරිවර්තනය වෙනුවෙන් රු.77,277 ක් ගෙවා තිබුණි. |
| (ඇ) | විශ්‍රාම වැටුප් චක්‍රලේඛ | |
| | 2010 මැයි 25 දිනැති අංක 4/2010 දරන චක්‍රලේඛය | අනියම් හා කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු 49 දෙනෙකු වෙනුවෙන් 2013 වර්ෂයේදී රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවා නොතිබුණි. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ - 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| | 4.2.3, 5.3.11, 5.4.8, 6.2.2 හා 6.3.6 මාර්ගෝපදේශ | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශවලට පටහැනිව ඇස්තමේන්තු වටිනාකම රු. 13,616,900 ක් වූ ආරක්ෂක සේවා ලබා ගැනීමේ කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. |

## 2.7 කාර්යසාධනය

-----------------

පශු සම්පත් හා ග්‍රාමීය වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය විසින් 2011 ජනවාරි මාසයේ දී පිළියෙල කරන ලද පශු සම්පත් ප්‍රධාන සැලැස්ම අනුව ශ්‍රී ලංකාව 2016 වන විට කිරිවලින් ස්වයංපෝෂිත කිරීමට අදාලව කිරි ලීටර් මිලියන 800 ක ඉලක්කයක් අපේක්ෂා කර තිබුණි. 2013 වසර වන විට කිරි ලීටර් මිලියන 381ක් ලඟා කරගෙන තිබුණි. එය 2010 වර්ෂයේ නිෂ්පාදිත ප්‍රමාණය සමඟ සැසඳීමේදී වාර්ෂික වර්ධනය සියයට 15 ක් වී තිබුණි. එම ධාරිතා මට්ටම තුළ 2016 වන විට කිරි ලීටර් මිලියන 500 ක නිෂ්පාදනයක් අපේක්ෂා කළහැකි අතර, වාර්ෂික ධාරිතා වර්ධනය මෙතැන් සිට සියයට 30 මට්ටමෙන් පවත්වා ගත හොත් අපේක්ෂිත ඉලක්ක සාධනය කරගත හැකි බවත් නිරීක්ෂණය විය. 2014 ජූනි 30 දින වන විටත් ධාරිතාවය දෙගුණ කිරීමේ පැහැදිලි වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. උපායශීලී සැලැසුමක් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර නොතිබීම තුළින් ඉහත ධාරිතා මට්ටමට ලඟාවීම සම්බන්ධයෙන් ගැටළු සහගත තත්ත්වයක් පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 2.8 කළමනාකරණ දුර්වලතා

----------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) 2011 වර්ෂයේදී අනුමත වූ ව්‍යාපෘති යෝජනාවකට අනුව පශු පර්යේෂණ ආයතනයට කිරි තාක්ෂණ රසායනාගාරයක් නම් වූ ව්‍යාපෘතිය, 2013 වර්ෂයේ සිට ආරම්භ කිරීමට සැලසුම්කර තිබුණි. නමුත් මෙම ව්‍යාපෘතියට අදාල ගොඩනැගිලි ඉදිකිරීම් 2014 ජූලි 15 දින වන විටත් නිමකර භාරදී නොතිබුණි. තවද මෙම ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 78 ක රසායන ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගැනීමට සැලැසුම් කර එයින් රු.මිලියන 11 ක් වැයකර 2012, 2013 හා 2014 වර්ෂවලදී රසායන ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගෙන තිබුණි. 2014 ජූලි 15 දින වන විටත් උපකරණ හා රසායන ද්‍රව්‍යවලින් බොහොමයක් භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණ අතර, උපකරණවල වගකීම් කාලයද ඉකුත් වී තිබුණි.

(ආ) දිනක් වයසැති කුකුළු පැටවුන්ගේ ලිංගාවරණය කිරීම සඳහා රු.243,470 ක් වැයකර නිලධාරීන් තිදෙනෙකු සඳහා ඉන්දියාවේදී සති 02 ක පුහුණුවක් ලබාදී තිබුණි. පුහුණුව ලද නිලධාරීන් සිටියදී එම සේවාව බාහිර පුද්ගලයෙකුගෙන් කරවා ගැනීම වෙනුවෙන් රු.11,609 ක අමතර වියදමක් සමාලෝචිත වර්ෂයේදී සිදු කර තිබුණි.

2.9 **මානව සම්පත් කළමනාකරණය**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 167 | 116 | 51 | - |
| (ii) | තෘතියික මට්ටම | 21 | 14 | 07 | - |
| (iii) | ද්විතියක මට්ටම | 330 | 264 | 66 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 34 | 271 | - | 237 |
| | | 552 | 665 | 124 | 237 |

සමාලෝචිත වර්ෂය අවසන් වන විට පුරප්පාඩු 124 ක් පිරවීමට ආයතනය කටයුතු කර නොතිබූ අතර එයින් පුරප්පාඩු 58 ක් විධායක මට්ටමේ තනතුරු වී තිබුණි.